# කෝපි වගාව

- කෝපි මල් පිපීම සඳහා බලපානු ලබන සාධක

දෛනික උපරිම හා අවම උෂ්ණත්වය (ඇරබිකා - 18-24, රොබස්ටා - 27-29)
තෙත් සහ වියළි තත්ත්ව පැහැදිලිව වෙන්ව පැවතීම හා අවම සති දෙකක වියළි කාලයක් පැවතීම
අඩු සුලං වේගයක් පැවතීම
මූලික අවධියේ සෙවන අවශ්‍යතාවය 50-60 % පැවතීම
සාපේක්ෂ ආර්ද්‍රතාවය 70-80% පමණ වීම.

- වසරක් තුලදී මල් පිපීම හා අස්වනු හට ගැනීම

| Crop | Season F/H | Jan | Feb | Mar | Apr | May | Jun | Jul | Aug | Sep | Oct | Nov | Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| Coffee | Year 1 Flow: 1 | | | ■ | ■ | ■ | | | | | | | |
| | Year 1 Harst: 1 | | | | | | | | | | | | ■ |
| | Year 2 Flow: 2 | ■ | ■ | | | | | | ■ | ■ | ■ | | |
| | Year 2 Harst: 2 | | | | ■ | ■ | ■ | | | | | | |

**කෝපි වගාවට සුදුසු ප්‍රදේශ**

- ඇරබිකා කෝපි

නුවර එළිය, මහනුවර, මාතලේ හා බදුල්ල දිස්ත්‍රික්ක වැනි ඇරබිකා වගාව සඳහා ප්‍රශස්ථ දේශගුණය සහිත තෙත් හා අන්තර් මැදි කලාප.

- රොබස්ටා කෝපි

කැගල්ල, කුරුණෑගල, මහනුවර, මාතලේ, ගම්පහ, මාතර හා ගාල්ල දිස්ත්‍රික්ක වැනි රොබස්ටා වගාව සඳහා ප්‍රශස්ථ දේශගුණය සහිත තෙත් හා අන්තර් මැදි කලාප.

**කෝපි ශාක ප්‍රචාරණය / Propagation**

- බීජ මගින්
- අතු කැබලි මගින්
- බද්ධ ක්‍රම මගින්

**මූල මණ්ඩලයේ අසංකූලතා (Coffee Root Disorders) මගහරවා ගැනීම සඳහා පැළ සිටුවීමේදී හා නඩත්තු කටයුතු කිරීමේදී සැලකිය යුතු විශේෂිත කරුණු**

- දිවයිනේ කුමන හෝ ප්‍රදේශයක කෝපි වගා කිරීමට නිර්දේශ ලබා දීමේදී පූර්ණ පාංශු පරීක්ෂාවක් හා කාලගුණික දත්ත විශ්ලේෂණයක් සිදු කල යුතුය.
- පැල සිටුවීමේ දී වලක ප්‍රමාණය අනිවාර්යයෙන්ම අඩි 2 x 2 විය යුතුය.
- අධි වර්ධිත හා පොලිතීන් බඳුනෙන් ඉවතට මුල් වර්ධනය වී ඇති පැල හැකිතාක් සිටුවීම සඳහා යොදා නොගත යුතු අතර එසේ සිටුවීමට ගන්නේ නම් ලබා දී ඇති නිර්දේශ අනුව සිටුවිය යුතුය.
- හානි දායි සතුන් විනාශ කිරීම සඳහා (white grubs) භාවිතයට ගන්නා කාබනික පොහොර හොඳින් Solarize (සූර්ය තාපනය) කල යුතුය.
- පොහොර කවය තුල සමාකාරව විසිරෙන පරිදි පොහොර යෙදිය යුතුය.

**ක්‍ෂේත්‍රයේ පැළ සිටුවීම**

**ඉඩම් තේරීම හා සැකසීම**

- හොඳින් ව්‍යාප්ත වූ වර්ෂාපතනයක් සහ ඉහළ තෙතමන ප්‍රමාණයක් (ජූනි සිට අගෝස්තු දක්වා)
- අධික උෂ්ණත්ව හෝ සීතල හෝ නිතරම පවතින සුළං හානිකර වේ.
- විවෘත ප්‍රදේශවල හෝ තේ වතුවල කෝපි වගා කිරීමේදී සුළං බාධක ශාක වගා කල හැක.
- පරණ තේ වතුවල අඩංගු තේ පඳුරු දිගටම ඉහළට වැඩීමට ඉඩ සැලැස්වීම
- පොල් හා රබර් වතුවල අතුරු වගාවක් ලෙස

**පැළ අතර පරතරය**

- ඉඩමේ බෑවුම අනුව වෙනස් වේ.
- අධික බෑවුම් සහිත ඉඩමක වගා කරන විට පේලි අතර පරතරය අඩුකළ යුතුවේ.
- තවද තනි වගාවක් ලෙස හෝ අතුරු වගාවක් ලෙස හෝ වගා කිරීම අනුව ද පරතරය වෙනස් වේ.
- කෝපි තනි වගාවක් ලෙස වගා කරන විට පහත සඳහන් පරතරයන්

  ඇරබිකා - මී.1.8 x 1.8 (හෙක්ටයාරයට පැල 3000) (තනි කඳන් )

  රොබස්ටා - මී.2.5 x 2.5 (හෙක්ටයාරයට පැල 1600) (තනි කඳන් හෝ ද්වී කඳන් )

  - මී.3 x 3 (හෙක්ටයාරයට පැල 1150) බහු කඳන්

**වළවල් සෑදීම**

- **වලක ප්‍රමාණය -** සෙ.මී.60 x 60 x 60
  - කොම්පෝස්ට් හෝ ගොම පොහොර 25 Kg ක් සහ රොක් පොස්පේට් 100 g
  - ඉවත් කරන පස්, එම වල වටා තුනී කර දැමීම
  - නිරිත දිග මෝසම් වැසි ලැබීමට පෙර එනම් මාර්තු/ අප්‍රේල් මාස වල දී වළවල් කැපීම සිදු කළ හැකිය.

**පැළ සිටුවීම**

- තෙත් කාලයේදී සිටුවීම
- පොලිතීන් බෑග් ප්‍රවේශමෙන් ගලවා දැමිය
- තෝරා ගත් හොඳ පැළ පමණක් සිටුවිය යුතුය.
- දුර්වල හෝ හොඳින් වර්ධනය නොවූ රෝගී පැළ ඉවත් කළ යුතුය.
- අධික ලෙස වර්ධනය වූ පැළ සෙ.මී.20 ක් ඉහළින් කපා දමා සිටුවිය යුතුය.
- පැළ නැවීම හා මුක්කු ගැසීම මගින් ද පැළවල හැඩය වුවමනා පරිදි සකස් කර ගැනීමට පුළුවන.
- හොඳින් වසුන් යෙදීම, කෝටු හිටුවීම හා පස හොඳින් තද කිරීම
- තාවකාලික සෙවණ යෙදීමෙන් වියලි කාලයේදී පැළ බේරාගත හැකිය.
- මෝසම් වැසි ආරම්භයේදී පැළ සිටුවීම මගින් පැළ හොඳින් ක්ෂේත්‍රයේ තහවුරුවීමට බොහෝ සෙයින් බලපායි.

**වගාව නඩත්තුවේදී හා මල් හට ගැනීමෙන් පසු සිදු කල යුතු ශෂ්‍ය විද්‍යාත්මක ක්‍රියාවන්**

1. වල් මර්ධනය

- අවුරුද්දකට හතර වරක් යාන්ත්‍රිකව / විසි කැති භාවිතයෙන්
- රසායනික වල් මර්ධනය නිර්දේශ නොකෙරේ - පරාග හා පරාගන කාරකයින්ට හානිකරයි

2. වසුන් යෙදීම

- පැළ වටා සෙ.මී.15 ක් පමණ උසක් දක්වා අතුරුණුවක්

- ගස පාමුල සිට අඟල් 6-12 ක් පමණ සම්පූර්ණයෙන්ම වල්පැල ගලවා ඉවත් කල යුතුය
- වසුන් බෝග හෝ කොළ පොහොර ක්ෂේත්‍රයට යෙදීම පාංශු සංරක්ෂණයට මෙන්ම අනවශ්‍ය වල් පැළෑටි ගහනය අඩු කිරීමට ද උපකාරි වේ.
- වසුන් බෝග සහ අමුකොළ පොහොර ශාක වර්ග මල් හට ගැනීමට පෙර කප්පාදුකර ක්ෂේත්‍රයට යෙදිය යුතුය.
- මෙම වසුන් බෝග දින 5-6 ක් ක්ෂේත්‍රයේ වියළුණු පසු පැළ පාමුල හෝ පැළ අතර යෙදීම කළ යුතුය

3. සෙවන පාලනය
    - සෙවණ ශාක (ග්ලිරිසීඩියා, එරබදු සහ ඇල්බීසියා )
    - කෝපි වගාව ආරම්භ කිරීමට මාස 06 - 12කට පෙර
    - කෝපි පැල පේලි දෙකක් හැර දෙකක්
    - සෙවණ ශාක කෝපි ශාකයේ වර්ධනයත් සමගම ක්‍රමයෙන් අඩුකළ යුතුය.
    - මෝසම් වැසි ලැබෙන කාලවලට පෙර කප්පාදු කළ යුතුවේ
    - ස්ථිර සෙවණ ශාක මී.12 -14 (හෙක්ටයාරයට ගස් 100ක්)
    - කෝපි බෝගය මූලික අවධියේදී සෙවණ සහිතව (50-60%) සහ පසුව සෙවණ රහිතව වගාකළ හැක.
    - අධිකව සූර්යාලෝකය ලැබුණු විට කෝපි බෝගය උසින් පමණක් වැඩේ

4. පොහොර යෙදීම
    - (U:R.PO4:MOP:Kesarite – 4:5:3:1)
    - මල් හට ගැනීමට පෙර අවධිය (මාර්තු- අප්‍රේල්) , මෝසම් වැස්සට පසු අවධිය (සැප් - ඔක්)
    - රොබස්ටා (එක් ගසක් සඳහා) වසරකට 700 g, ඇරබිකා (එක් ගසක් සඳහා) වසරකට 400 g

5. pH අගය පාලනය
    - pH 5 -6.5
    - pH අගය ඒකක එකකින් ඉහල දැමීම සඳහා ඩොලමයිට් 500 kg
    - ආම්ලික පසට ඩොලමයිට් යෙදීම
    - පාංශු ව්‍යුහය දියුණු කිරීම
    - පසේ පොස්පරස් වල සුලභතාව වැඩි කිරීම
    - ක්ෂුද්‍ර මූල ද්‍රව්‍යවල අවශෝෂණය වැඩි කිරීම

6. අධික සුලඟ පාලනය
    - සුලඟේ වේගය පැ.කි.මී. 30 / තත්.මී. 8 ට අඩු විය යුතුය.
    - සුලං භාධක ගස් සිටුවීම -
    - Picea spp.
    - Pine (Pinus spp.)
    - Willow (Salix spp.)
    - සුලං මුහුනත්වල ඇති අධික බෑවුම් වල වගා නොකිරීම

7. රෝග පළිබෝධ පාලනය
    - නෙමටෝඩාවන් (***Pratylenchus spp.***):

- ගොලුබෙල්ලන් සහ කටුස්සන්
- හිටු මැරීම **(Damping off) (*Rhizoctonia solani*)**
- දුඹුරු පුල්ලි රෝගය **(*Circospora coffeicola*)**
- ඌණතා රෝග **(Deficiency symptoms)**
- කෝපි **(Berry)** ගෙඩි ගුල්ලා **(*Hypothenemus hampei)***
- කඳ ගුල්ලා **(*Xyleborus morstatti*)**
- කම්බිලි පණුවා **(*Anomala spp., Holotrichia spp.*)**
- රතු කඳ ගුල්ලා **(*Zeuzera coffeaa*)**
- යුෂ උරා බොන්නෝ **(Scale Insects)**
- කොළ මකුණා **(Soft Green Scale – *Coccus viridis*)**
- දුඹුරු මකුණා **(Helmet Scale –*Saissetia coffeae*)**
- කෝපි මලකඩ රෝගය **(*Hemileia vastatrix*)**
- කලු පිටිපුස් රෝගය **(*Capnodium spp.*)**
- ඇන්ත්‍රැක්නොස් **(*Colletotrichum gloeosporiodides*)**

8. කප්පාදු කිරීම

**කප්පාදු කිරීමේ අරමුණු**

- තිරස් අතු වැඩිකර ගැනීම
- ගස මනාව හැඩගස්වා ගැනීම
- රෝගී මැරී ගිය අතු ඉවත් කිරීම
- රෝග හානි අඩු කර ගැනීම
- **එකවර මල් පිපීම උත්තේජනය කිරීම**
-

**<u>කෝපි ගසේ ශාකණය හා ව්‍යුහය</u>**

**කෝපි ශාකය ද්විබීජ පත්‍රී ශාකයකි.**
**බහු කඳන් වර්ධනය කර ගන්නා ශාකයකි.**
**කෝපි ශාකය ශාකා වර්ග හතරක් (4) වර්ධනය කරයි**

1. **ප්‍රධාන කඳ**
2. **ප්‍රාථමික අතු (ප්‍රධාන කඳෙන් හෝ ද්විතීක අතු වලින් ඉහලට හට ගන්නා දිය රිකිලි)**
3. **ද්විතීක අතු (ප්‍රධාන කඳෙන් තිරස්ව හටගන්නා ශාකා)**
4. **තෘතීක අතු (ද්විතීක අතු වලින් තිරස්ව හටගන්නා ශාකා)**

- **මෙම ශාකා වලින් ප්‍රාථමික ශාකා ඉවත් කල යුතු අතර ද්විතීක හා තෘතීක ශාකා සංඛ්‍යාව වැඩි කර ගත යුතුය.**

**කෝපි ගස පුහුණු කිරීම**

- **කෝපි ගසෙහි වැඩිපුර ද්විතීක හා තෘතීක අතු ප්‍රමාණයක් වර්ධනය කර ගැනීම සඳහාත් ප්‍රධාන කඳෙහි ඇදවීම් නැවීම් වලක්වා ගනිමින් ඍජු කඳක් වර්ධනය කර ගැනීම සඳහාත් ගස පුරුදු පුහුණු කල යුතුය.**
- **කෝපි ගස සිටුවා පලමු මාසයේදීම ගස පුහුණු කිරීම ආරම්භ කල යුතුය.**
- **මේ සඳහා**

1. **පැලය / ගස ඇද බැඳීම,**
2. **දිය රිකිලි වර්ධනය වී ඇත්නම් ඉවත් කිරීම**

3. **කඳ ශක්තිමත්ව සෘජුව වර්ධනය වීමට ආධාරක සැපයීම කල හැකිය**

**කෝපි ගස කප්පාදු කිරීම**

කප්පාදු කිරීම කෝපි විශේෂය අනුව වෙනස් වේ. ඇරබිකා විශේෂය සඳහා කප්පාදු ක්‍රම යෙදීම අවශ්‍ය නොවන අතර නඩත්තු කප්පාදුව පමණක් සෑහේ. රොබස්ටා කෝපි සඳහා කප්පාදු ක්‍රමයක් යොදාගනිමින් නඩත්තු කප්පාදුවද සිදුකල යුතුය.

**නඩත්තු කප්පාදුව**

- අනවශ්‍ය ජල ප්‍රරෝහ
- ප්‍රධාන කඳ වටා ඇති වන සියලුම ප්‍රාථමික අතු කපා ඉවත් කළ යුතුය.
- තිරසට වැඩුන බිම ගෑවුන අතු
- මියගිය හා බිම ඇතිල්ලෙන අතු
- ශාකයේ ඉහළට වන්නට පිහිටා ඇති නැමුන හෝ දිගැටි අතු
- ඉහළට, පහළට හා අතු හරහා අක්‍රමවත්ව වැඩී ඇති සියළු අතු ඉවත් කළ යුතුය.
- ශාකය නැවත දුර්වල වූ විට කලින් පුනුරුත්ථාපනය යටතේ සඳහන් කළ පරිදි නැවත මුලින් කප්පාදු කර අළුත් ශාකයක් ලබාගත යුතුය

**ඇරබිකා කෝපි කප්පාදු කිරීම**


- ඇරබිකා කෝපි ශාක සඳහා කප්පාදු ක්‍රම යෙදීම අවශ්‍ය නොවේ.
- ශාකය පුහුනු කිරීම හා නඩත්තු කප්පාදුව අවශ්‍ය වේ.
- ශාකය සිටවූ මුල් අවධියේ සිට පුහුණු කිරීම ආරම්භ කල යුතු අතර, දිය රිකිලි කප්පාදු කරමින් ද්විතීක හා තෘතීක අතු වර්ධනය කර ගත යුතුය.
- මීටර දෙකක් පමණ උසට ශාකය වැඩුන විට අග්‍රස්ථ අංකුරය ඉවත් කර හරස් අතු පමණක් වැඩීමට සැලැස්විය යුතුය.
- මීටර දෙකේ (2m) මට්ටමින් ශාකය පවත්වා ගැනීම කල යුතුය.

**රොබස්ටා කෝපි කප්පාදු කිරීම**

- රොබස්ටා කෝපි සඳහා කප්පාදු ක්‍රම යෙදීම අවශ්‍ය වේ.
- ශාකය පුහුනු කිරීම හා නඩත්තු කප්පාදුවද අවශ්‍ය වේ.
- ශාකය සිටවූ මුල් අවධියේ සිට පුහුණු කිරීම ආරම්භ කල යුතු අතර, දිය රිකිලි කප්පාදු කරමින් ද්විතීක හා තෘතීක අතු වර්ධනය කර ගත යුතුය.

තනි කඳන් තනි තට්ටුවේ ක්‍රමය

- ශාකය මීටර 2ක් පමණ උසට නිදහසේ වැඩෙන්නට සැලැස්වීම.
- අග්‍රස්ථ අංකුරය ඉවත් කිරීම
- උපරිම උස මීටර 2ක් දක්වා පවත්වාගෙන යාම.
- ප්‍රධාන කඳෙන් හා අනෙකුත් ශාකා වලින් ඉහලට වැඩෙන දිය රිකිලි ඉවත් කිරීම.
- පැල සිටුවීමෙන් වසර 3ක පමණ කාලයක් ගතවේ.




තනි කඳන්, තනි තට්ටුවේ ක්‍රමය

තනි කඳන් තට්ටු දෙකේ ක්‍රමය

- ශාකය මීටර 1ක් උසට වර්ධනය වූ පසු (පැල සිටුවා වසර 2.5කින් පමණ පසුව) අග්‍රස්ථ අංකුරය ඉවත් කල යුතුය.


- කප්පාදු කිරීමෙන් පසු ප්‍රධාන කඳෙන් මතුවන ජල ප්‍රරෝහ (සිරස් අතු) වලින් එකක් පමණක් තිබෙන්නට හැර අනෙකුත් සියළුම ජල ප්‍රරෝහ ඉවත් කිරීම.
- ඉතිරි කල සිරස් අත්ත මීටර 2ක් දක්වා උසකට වැඩෙන්නට සැලැස්වීම හා අග්‍රස්ථ අංකුරය ඉවත් කිරීම.
- ශාකය උපරිම උස මීටර 2 කින් නඩත්තු කල යුතුය.



තනි කඳන්, තට්ටු දෙකේ ක්‍රමය

ද්වී කඳන් ක්‍රමය


- පැළ සිටුවා මාස 3-4ක් ගතවූ පසු පැළය නමා කරු ගැසීමෙන් සිරස් රිකිළි ඇතිකර ගැනීම.
- සිරස්ව වැඩෙන අතුදෙකක් ඉතිරිකර අනෙක් සියළු අතු ඉවත් කල යුතුය.
- ශාකයේ පහළින් මතුවන රිකිළි සියල්ලද ඉවත් කිරීම
- වර්ධනය වන කඳන් දෙකෙහි උස මීටර 2කට නඩත්ති කිරීම.
- කඳන් දෙකෙහි ඉහලින් හට ගන්නා රිකිළිද සියල්ල ඉවත් කල යුතුය.



ද්වි කඳන් ක්‍රමය

බහු කඳන් ක්‍රමය

- පැළ සිටුවා මාස 3-4ක් ගතවූ පසු පැළය නමා කරු ගැසීමෙන් සිරස් රිකිළි ඇතිකර ගැනීම.
- සිරස්ව වැඩෙන අතු 3-5 ක් ඉතිරිකර අනෙක් සියළු අතු ඉවත් කල යුතුය.
- උස මීටර 2කට පාලනය කිරීම අවශ්‍ය නොවේ.
- අවු. 3-4ක් ඵල දැරීමෙන් පසු ඒවා මුළින් කප්පාදු කර නැවත බහු කඳන් ඇති කර ගත හැකිය.



බහු කඳන් ක්‍රමය

**පැරණි කෝපි ගස් පුනරුත්ථාපනය කිරීම**

- පැරණි කෝපි ගස් සහිත ඉඩම් කිසිම ආර්ථික වශයෙන් ඵලදායි ඵලදාවක් නොලැබෙන අතර, අස්වැන්න නෙලීම ද දුෂ්කරය.
- කටිමූර්  පැරණි වන විට කොළ හැලී අතු මැරී ඉපල් බේරුණු ස්වභාවයක් දරයි
- ඒ නිසා මෙවැනි කෝපි ගස් මුලින්ම කප්පාදු කර පුනරුත්ථාපනය කළ හැකිය.
- මේ කප්පාදුව වැසි කාලයේ මැද දී කල යුතුය.
- පැරණි ගස පොළොවේ සිට සෙ.මී.15-20ක් උසින් $45^0$ කෝණයට සිටින සේ කැපිය යුතුය.
- දීලිර හානි හෝ වේයන්ගෙන් බේරා ගැනීම සඳහා කැපුම් මුහුණත දීලිර නාශකයකින් හෝ තාර වලින් හෝ වෙනත් තීන්ත වර්ගයකින් ආලේප කළ යුතුය







**නඩත්තු කප්පාදුව**

- අනවශ්‍ය ජල ප්‍රරෝහ
- ප්‍රධාන කඳ වටා ඇති වන සියලුම ප්‍රාථමික අතු කපා ඉවත් කළ යුතුය.
- තිරසට වැඩුන බිම ගෑවුන අතු
- මියගිය හා බිම ඇතිල්ලෙන අතු
- ද්විතියික අතු ගණන 3-4කට සීමා කිරිමෙන් ශාකයට හොඳින් ආලෝකය ලැබීමට ඉඩ සැලසේ.
- ශාකයේ ඉහළට වන්නට පිහිටා ඇති නැමුන හෝ දිගැටි අතු
- ඉහළට, පහළට හා අතු හරහා අක්‍රමවත්ව වැඩී ඇති සියළු අතු ඉවත් කළ යුතුය.
- ශාකය නැවත දුර්වල වූ විට කලින් පුනුරුත්ථාපනය යටතේ සඳහන් කළ පරිදි නැවත මුලින් කප්පාදු කර අළුත් ශාකයක් ලබාගත යුතුය

**කෝපි කප්පාදු කිරීම සඳහා අවශ්‍ය උපකරණ.**

- කප්පාදු කියත
- ක්ෂේත්‍ර පිහිය
- සෙකැටියරය
- ප්‍රථමික ශාඛා සහ අනවශ්‍ය මොරෙයියන් ඉවත් කිරීමට සෙකැටියරය යොදා ගැනේ.
- $45^0$ කෝණයට පරණ අතු ඉවත් කිරීමට කප්පාදු කියත යොදා ගැනේ.
- ක්ෂේත්‍ර පිහිය යොදා ගෙන අතු කුඩා කැබලි වලට කපා ගත හැකි ය.



